ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

**01. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 24 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

---------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි 24 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු දේපල තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | අදාල දේපලවල තක්සේරුවක් සිදුකර ස්ථාවර වත්කම් ලේඛණ විධිමත් පරිදි යාවත්කාලීන කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උප ලේඛන අනුව කර්මාන්ත ණයහිමි ශේෂය රු.42,599,857 ක් වූ නමුත් රු.15,819,846 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණන අවස්ථාව වන විට ණය හිමි ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මැල්සිරිපුර බස්නැවතුම්පළ කඩ කාමරවලට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු පෙර ගෙවුම් මුදල් රු. 3,703,596 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ගිණුම් විෂයයන් 13 කට අදාළව මූල්‍ය ප්‍රකාශන ශේෂ සහ ලේඛන අනුව ශේෂ අතර රු.18,287,863 ක නොසැසඳීම් පැවතුණි. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ලේඛන ශේෂ නොකිරීම ඇතුළු විවිධ හේතු මත ඇති වී පවතින වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් හා ප්‍රා.ස. 07 ආකෘතිය ප්‍රකාරව හිඟ ආදායම් අතර රු. 434,636 ක වෙනස්කම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රා.ස 07 නිවැරදි කිරීමට උපදෙස් දුනිමි. |
| (ඊ) | වටිනාකම රු. 65,365,501 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළව ලේඛන, උපලේඛන සහ කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අවසන් ගිණුම තුළින් පෙන්වා දී ඇති විස්තර ඇතුළත් උපලේඛන 2020 අවසන් ගිණුමට ලබා දෙන බවත්, ලේඛන යාවත්කාලීන කරන බවත් කාරුණිකව දැනුම් දෙමි. |
| (උ) | එකතුව රු. 204,000 ක් වූ ගෙවීම් වවුචර් 03 ක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | සියළු ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 1.4 අනුකූල නොවීම්

-------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 132 (ඒ) වගන්තිය | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පුද්ගලික හෝටලයක පැවති වැඩමුළුවක් සඳහා රු. 175,310 ක් වැයකර තිබුණි. | සභා අරමුදල්, අරමුණු ඉටුවන පරිදි ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස වැය කිරීමට කටයුතු කළ යුතුවේ. | අයවැය ලේඛනය මගින් පුහුණු සඳහා මුදල් වෙන් කර තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා ( මූල්‍ය හා පරිපාලන ) රීති 5 (7) | ක්‍රමවත් ආකාරයට අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන යනු ලබන බවට සභාපතිවරයා සහතික වී නොතිබුණි. | රීති, මුදල් රෙගුලාසි හා ජාතික විගණන පනත අනුව විධිමත් අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වා ගත යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570,571 | තැන්පත් කළ දින සිට වසර 02 ක් ඉක්මවූ රු.5,288,014 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | වසර 02 ඉක්මවූ ආදායමට ගත හැකි තැන්පත් ශේෂ හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 39,197,138ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 80,054,719ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2019වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. | වරිපනම් හා බදු | 4,014 | 6,697 | 4,606 | 5,280 | 4,259 | 7,207 | 4,440 | 6,054 |
| II. | බදු කුලී | 13,885 | 13,468 | 12,436 | 2,330 | 14,636 | 12,618 | 12,771 | 2,009 |
| III. | බලපත්‍ර ගාස්තු | - | 1,205 | - | - | - | 1,316 | | - |
| IV. | වෙනත් ආදායම් | 152,512 | 146,431 | 126,519 | 27,270 | 171,620 | 185,546 | 89,038 | 119,603 |
| එකතුව | | 170,411 | 167,801 | 143,561 | 34,880 | 190,515 | 206,687 | 106,249 | 127,666 |

**2.2.2 වරිපනම් හා බදු**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති රු.4,933,871 ක වරිපනම් හා අක්කර බදු ශේෂයෙන් රු. 3,166,337 ක් වසරකට වඩා වැඩි කාලයකට අදාළ විය. | ප්‍රාදේශීය සභා පනත හා රීති අනුව ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අදාල සියලු පාර්ශවයන් දැනුවත් කර, පවතින හිඟ වරිපනම් බදු අයකිරීම ප්‍රාදේශීය සභා පනතේ 158 (1) අ, අ(ආ) සහ 1988 මූල්‍ය හා පරිපාලන රීති 32 – 42 ප්‍රකාරව සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. |

**2.2.3 කුලී**

------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 2,330,593 ක් වූ බදු කුලී ශේෂයෙන් රු.1,543,693 ක් වසර ගණනාවක සිට පැවත එන වත්කම් බදුදීම් අවස්ථා 32 කට අදාළ විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ශේෂ අයකර ගැනීම සඳහා ගිවිසුම් ඇප හිලව් කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 ප්‍රකාරව ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් කර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතු වේ. | විගණනයෙන් පෙන්වා දුන් පරිදි 2019 වර්ෂය සඳහා ඉහත කී ගොනුවට අනුව සකස් කර නොතිබූ සමීක්ෂණ වාර්තාව මේ වනවිට සකස් කර ඇත. |

## 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,800,000 ක් හා මුද්දර ගාස්තු රු. 17,421,396 ක් විය. | හිඟ ශේෂ අයකර ඵලදායී මහජන සේවාවක් සැපයීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු 2019.12.31 දින වන විට නොවැම්බර් හා දෙසැම්බර් මාසවල පමණක් අයකර ගැනීමට ඇති අතර අනෙකුත් සියළු මුදල් අයකරගෙන ඇති බව කාරුණිකව දැනුම් දෙමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අයවැයගත කර්මාන්ත ඉටුනොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අයවැයගත රු.14,000,000 ක් වූ කර්මාන්ත 58 ක් ඉටුකර නොතිබුණි. | අයවැයගත කර්මාන්ත ඉටුකර මහජන සේවා ඵලදායී ලෙස ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | අයවැය ලේඛනය සකස් කිරීමේදී විවිධ සංවිධාන සහ සභා මන්ත්‍රීවරුන්ගෙන් යෝජනා අරගෙන උප ලේඛනය සකස් කලත් හදිසියේ කළයුතු වැඩ නිසා උප ලේඛනයේ සදහන් කාර්යයන් කිරීමට නොහැකි විය. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු.6,000,000 ක් වැයකර අක්කර 03 පර්චස් 15.5 ක ඉඩමක් මිලදී ගෙන තිබුණු නමුත් වාර්ෂිකව එකතු කරනු ලබන ටොන් 3360 ක් පමණ වූ කසළ වර්ගීකරණය කිරීමකින් තොරව පෞද්ගලික ඉඩමක වල දැමීම සිදුකර තිබුණි. | කසල වර්ගීකරණය කර නොදිරන හා දිරන කසළ ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | සමස්ථ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් එකවර ඉදිකිරීම් සඳහා සහා අරමුදලෙන් වැය දැරීමට පවතින ප්‍රතිපාදන හිඟය මත කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය උපකරණ ලබාගැනීම සඳහා ප්‍රතිපාදන ඉල්ලීම් පළාත් පාලන කොමසාරිස් හරහා ඉදිරිපත් කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ දී රු.693,412 ක් වැයකර ඉදිකරන ලද හිරිපිටිය මාළු කඩය ආදායම් ඉපයීමට යොදාගෙන නොතිබුණි. | සභා අරමුදල් ඵලදායී කාර්යයන්ට යෙදවීමට කටයුතු කළ යුතු වේ. | හිරිපිටිය මාළු කඩය ඉදිකරන අවස්ථාව වනවිට වෙනත් මාළු කඩයක් නොතිබූ බැවින් මෙය ඉදිකලත් ටෙන්ඩර් කිරීමේදී මෙම මාළු කඩය කිසිවකු නොගන්නා බව දැනුම් දෙමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකමින් 2020 අප්‍රේල් 31 දින වන විට තවදුරටත් අයවිය යුතු ශේෂය රු. 31,398,387 ක් විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ බදු කුලී මුදලින් හා කඩකුලිය රු. 34,240 ක මුදලක් ලැබී ඇත. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකමින් වසරකට වැඩි කාලයකට අදාළ ශේෂය රු.12,474,071 ක් විය. | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ආපසු ගෙවිය යුතු තැන්පත් ආදායම් වෙනුවෙන් තැන්පත් සහ ටෙන්ඩර් තැන්පතු ශේෂයන් ඉදිරි වර්ෂවලදී ටෙන්ඩර් ආදායමට හිලව් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | අනුමත හා තත්‍ය කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 19 ක් පැවැති අතර අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 12 ක් බඳවාගෙන තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට, කටයුතු කළ යුතු වේ. | අනුමත රියදුරන් සංඛ්‍යාව 06 ක් පමණක් වුවද සභාව සතු වාහන සංඛ්‍යාව 16 කි. අනුමත ආදාහනාගාර භාරකරුවන් සංඛ්‍යාව 01ක් වුවද, සභාව සතුව ආදාහනාගාර 02 ක් පවතී. නිවාඩු දිනයන්හි සේවයේ යෙදවීමට විධිමත් පරිදි ආදේශක ආයුර්වේද වෛද්‍යවරියක් බඳවාගෙන ඇත. |
| (ii) | වසර 03 සිට වසර 07 ක කාලයක් තුළ අය නොවන රු. 135,069 ක සේවක ණය ශේෂ 03 ක් විය. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.8,300 ක් විශ්‍රාම පාරිතෝෂිතයෙන් හා මරණ පාරිතෝෂිතයෙන් අය කර ගැනීමට නියමිතය. රු.126,769ක ශේෂය සඳහා ලිපි මඟින් දැනුවත් කර ඇත. |

**3.4** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මැල්සිරිපුර බස්නැවතුම්පල කඩකාමර පෙර ගෙවුම් ක්‍රමයට ලබාදීමේදී ගිවිසුම්ගතව නොතිබුණු අතර 2018 පෙබරවාරි 09 දින අත්සන් කර තිබූ ගිවිසුම ප්‍රකාරව මාස 03 ක් ඇතුළත ඉතිරි පෙරගෙවුම් මුදල් නොගෙවුවහොත් නැවත ටෙන්ඩර් කිරීමට බදු දීමනාකරුට බලය ඇතත්, එපරිදි කටයුතු කර නොතිබීම නිසා රු.3,703,596 ක් අයවීමට තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදාල පාර්ශයවයන් දිගින් දිගටම මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇති අතර ඉදිරියේදී නිතිමය කටයුතු සිදුකර ඉතිරි හිඟය අයකරගන්නා බව කාරුණිකව දැනුම් දෙමි. |

**3.5** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| හිරිපිටිය පොළ ඉදිරිපිට කළුගල්ල පාර වම්පස පිහිටි කඩකාමර 06 ක් සඳහා බදුකරුවන් හිමිකම් ප්‍රකාශකර ඇති නමුත්, එකී කඩකාමරවල හිමිකාරීත්වය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා දේපල නිරවුල් කර විධිමත් පරිදි බදුදීමට කටයුතු කළ යුතු වේ. | මෙම කඩකාමර 06 හි නිරවුල් හිමිකාරිත්වය ඉදිරියේදී ලබාගෙන සභාවට හිමි ආදායම ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම්දෙමි. |

**3.6** **වත්කම් කළමනාකරණය**

**--------------------------**

**3.6.1** **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

**---------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු.6,000,000 ක් වටිනා අක්කර 03 පර්චස් 15.5 ක ඉඩම වටා ආරක්ෂිත කම්බි වැටක් ඉදිකර නොතිබීම නිසා ඉඩමේ පොල් එලදාව සභාවට අහිමි වී තිබුණි. | සභා වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 අයවැය ලේඛනය සඳහා මෙම භූමියට ආරක්ෂක වැටක් ඉදිකිරීමේ වැඩ විෂයය ඇතුලත් කර ඇත. |

**3.6.2** **පවරා නොගත් වත්කම්**

**-----------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු.13,233,000 ක් වටිනා වාහන 03 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම වාහන 03 කඩිනමින් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දැනුම්දෙමි. |

### 3.6.3 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2014 වර්ෂයේ දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකළ ඉබ්බාගමුව සතිපොළ නිශ්කාර්යයව පැවතුණි. | සභාව සතු සියළු වත්කම් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉබ්බාගමුව සති පොළ දැයට කිරුළ යටතේ ඉදිකළ නව පොළ ගොඩනැගිල්ල වෙත ගෙනයාමට නොහැකිව ඇත්තේ පැරණි පොළ භූමියේ අයිතිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු අධිකරණ 03 ක විභාග වන නඩු හේතුවෙනි. |
| (ආ) 2015 හා 2016 වර්ෂවල පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 13,075,000 ක් වටිනා ගලි බවුසරය හා කම්පැක්ටරය නිශ්කාර්යව පැවතුණි. | ඵලදායී ලෙස යොදා ගැනීමට නොහැකි නම් අවශ්‍යතාවය පවතින ආයතනයකට ලබාදීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපෘති යෝජනාවක් සකසා මළ ද්‍රව්‍ය බැහැරලන ස්ථානයක් සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට යෝජිතය. ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය ආරම්භ කළ පසු කම්ෆැක්ටරය ප්‍රයෝජනයට ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි. |

### 3.7 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආයතන සංග්‍රහයේ ix වැනි පරිච්ඡේදයේ පළමු වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 1990 ජූනි 05 දිනැති පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3(ආ) විධිවිධානවලට පටහැනිව 2017 වර්ෂයේ සිට 2019 වර්ෂයේ පෙබරවාරි 26 දින දක්වා ඉබ්බාගමුව, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබී තිබුණු පරිපාලන වියදම් මුදලින් සියයට 25 ක් සභා අරමුදලට බැර කර ඉතිරි සියයට 75 ක මුදල වන රු.943,842 ක් සභාවේ සේවයේ නියුතු කාර්යය මණ්ඩලයේ 19 දෙනෙකු අතර සභා තීරණ මත බෙදාදී තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍ර ලේඛනයට පටහැනි වුවද රජයට පාඩුවක් නොමැති බව දන්වන අතර අදාළ රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් එවන ලද මුදල් අදාළ පාර්ශවයන්ට ගෙවූ බව කාරුණිකව දැනුම් දෙමි. |